සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **පුරවැසි අධ්‍යාපනය - I** කාලය පැය 03 යි.

නම/ විභාග අංකය:

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලන කටයුතු සිදුකලේ
    (1) ඍජු ප්‍රජාතන්ත්‍රවාදි ලක්‍ෂණ පදනම් කරගෙනය.
    (2) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදි ලක්‍ෂණ පදනම් කරගෙනය.
    (3) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදි ලක්‍ෂණ පදනම් කරගෙනය.
    (4) ව්‍යවස්ථානුගත ප්‍රජාතන්ත්‍රවාදි ලක්ෂණ පදනම් කරගෙනය.

02. ක්‍රි. ව. 15 වන සියවසෙන් පසු යුරෝපයේ බිහිවීම ඇරඹුණු රාජ්‍ය ක්‍රමය වන්නේ
    (1) සමාජවාදී රාජ්‍ය ක්‍රමයයි.
    (2) පැසිස්ට්වාදී රාජ්‍ය ක්‍රමයයි.
    (3) ලිබරල්වාදී රාජ්‍ය ක්‍රමයයි.
    (4) ජාතික රාජ්‍ය ක්‍රමයයි.

03. 1688 සිදු වූ ඉංග්‍රීසි විප්ලවයෙන් පසු
    (1) රජුගේ බලය සීඝ්‍ර ලෙස වැඩිවිය.
    (2) පාර්ලිමේන්තුවේ බලය වර්ධනය විය.
    (3) අධිකරණ පද්ධතියෙහි බලය ප්‍රවර්ධනය විය.
    (4) විධායක ආධිපත්‍යයක් ක්‍රියාත්මක විය.

04. පාලන ක්‍රමයක් ලෙස ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක වීමේදී මතුවන ගැටලුවක් වන්නේ,
    (1) වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමානයෙන් කුඩාවීමය.
    (2) වර්තමාන රාජ්‍ය වල ජනගහනය අධික වීමය.
    (3) වර්තමාන රාජ්‍ය වල සමාජ අවශ්‍යතා අසංකිරණ වීමය.
    (4) සියලු පුරවැසියන් එක් තැනකට ඒකරාශී කිරීම පහසු වීමය.

05. ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍ය බලයට අයත් වන්නේ
    (1) මූලික අයිතිවාසිකම්, පාලන බලතල හා ඡන්ද බලය.
    (2) මූලික අයිතිවාසිකම්, පාලන බලතල හා මූලික යුතුකම්
    (3) මූලික යුතුකම්, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය
    (4) ඡන්ද බලය, මූලික යුතුකම්, පාලන බලතල.

06. ප්‍රජාතන්ත්‍රවාදි පාලනයක ක්‍රියාකාරීත්වය සඳහා අත්‍යාවශ්‍ය අංගයක් වන්නේ,
    (1) දේශපාලන පක්‍ෂ (2) විරුද්ධ පක්‍ෂය. (3) ජනමාධ්‍ය. (4) අධිකරණය.

07. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සඳහා ජනතා නියෝජිතයන් සම්බන්ධ කර ගැනීමට යොදාගන්නා උපායමාර්ගයක් වන්නේ,
    (1) රට ඡන්ද කොට්ඨාශ වලට බෙදා වෙන්කිරීම ය.
    (2) තරඟකාරී පක්‍ෂ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ය.
    (3) දේශපාලන පක්‍ෂ ක්‍රමය වැඩි දියුණු කිරීම ය.
    (4) ජනතාවගේ ඡන්ද බලය ජනතා නියෝජිතයන්ට ප්‍රදානය කිරීම ය.

08. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
 (1) නියමිත කාලසීමාව ඉක්මවා මැතිවරණ පැවැත්වීමයි.
 (2) මැතිවරණ නීති රීති වලට අනුකූලව මැතිවරණ පැවැත්වීමයි.
 (3) සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත්වීමයි.
 (4) නිදහසේ මැතිවරණ කටයුතු වලට සහභාගී වීමට ඇති අයිතිය තහවුරු වී තිබීමයි..

09. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යභාරය වන්නේ,
 (1) ආණ්ඩු පක්ෂය ඉටුකරන අයහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබාදීම.
 (2) ආණ්ඩු පක්ෂයේ ක්‍රියාකාරකම් නිතර විවේචනය කිරීම.
 (3) වඩා යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමට ක්‍රියාකිරීම.
 (4) ආණ්ඩු පක්ෂයේ ප්‍රතිපත්ති වලට විරුද්ධවීම.

10. මිනිසුන් නිදහස බුක්තිවිඳිය යුත්තේ,
 (1) නීතිමය සීමාවන්ට යටත්වය. (3) තම ජීවිතය පරිපූර්ණ කර ගැනීමටය.
 (2) තමන්ගේ අභිමතය පරිදිය. (4) සදාචාරමය සීමාවන්ට යටත්වය.

11. මිනිසෙකු ලෙස ගරුත්වයෙන් යුතුව සමාජයේ ජීවත්වීම සඳහා ඔහුට උපතින් ලැබෙන අයිතීන්,
 (1) මූලික අයිතිවාසිකම් වේ. (3) සිවිල් අයිතිවාසිකම් වේ
 (2) මානව අයිතිවාසිකම් වේ. (4) සමාජීය අයිතිවාසිකම් වේ.

12. රටක මූලික නීතිය වන්නේ,
 (1) සිවිල් නීතියයි. (2) පොදු නීතියයි.
 (2) රෝම ලන්දේසි නිතියයි. (4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නිතියයි.

13. ආණ්ඩුව වෙත ජනතාවගේ අදහස් දැනුම් දීමේ හැකියාව පවතින්නේ
 (1) ජනමාධ්‍යයටය. (3) මහජන නියෝජිතයන්ටය.
 (2) විරුද්ධ පක්ෂයටය. (4) බලපෑම් කණ්ඩායම් වලටය.

14. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක නිදහස හා අයිතිවාසිකම් සුරැකිම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබන්නේ,
 (1) පොලීසියයි. (2) සිවිල් සේවයයි. (3) අධිකරණයයි. (4) සන්නද්ධ හමුදාවයි.

15. නීතියේ ආධිපත්‍ය පවතින බව විදහාපාන ලක්ෂණයක් වන්නේ,
 (1) සැවොම නීතියට ගරුකිරීම, අවනත වීම හා නීතිය අභිබවා යාමයි.
 (2) පවතින නීතියට යටත්ව සැකකරුවන්ට දඬුවම් පැමිණවීමයි.
 (3) චෝදනා පත්‍රයක් යටතේ පමණක් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමයි.
 (4) නීතියේ විශේෂ රැකවරණය පාලකයන්ට ලබා දීමයි.

16. ජාතික රාජ්‍ය සංකල්පය ශක්තිමත් කිරීමට දායක වූ දේශපාලන චින්තකයින් වන්නේ,
 (1) මැකියාවලි හා ජීන් බොඩෑන්. (3) තෝමස් හොබ්ස් හා ඇරිස්ටෝටල්.
 (2) ප්ලේටෝ හා ජීන් බොඩෑන්. (4) මැකියාවලි හා ඇරිස්ටෝටල්.

- පහත ප්‍රකාශ කියවා 17, 18 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

 A - සමාජ සිරිත් විරිත් පිළිපැදීම. B - රජයට නියමිත බදු ගෙවීම.
 C - වැඩිහිටියන්ට ගරු කිරීම. D - පවතින නීතියට ගරු කිරීම.
 E - නීතිය හා සාමය ආරක්ෂා කිරීමට සහායවීම. F - දෙමාපියන්ට සැලකීම.

17. ඉහත ප්‍රකාශ වලින් සදාචාරාත්මක යුතුකම් පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
 (1) ABC (2) ACF (3) BCE (4) CDE.

18. ඉහත ප්‍රකාශවලින් නීතිමය යුතුකම් පමණක් අඩංගු පිළිතුර තෝරන්න,
 (1) ABC (2) ACF (3) BDE (4) CDF

19. මැතිවරණයකදී මහජනතාවට හිතැති ආණ්ඩුවක් පත්කර ගැනීමේ ක්‍රියාවලියේ වැදගත්ම කාර්යභාරය පැවරෙන්නේ,
   (1) මහජනතාවටය.
   (2) ඡන්දදායකයන්ටය.
   (3) ඡන්ද අපේක්ෂකයන්ටය.
   (4) සිවිල් පුරවැසියන්ටය.

20. ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්ම සඳහා පුරවැසියෙකු සතුවිය යුතු වැදගත් ගුණාංග අඩංගු පිළිතුර තෝරන්න,
   A - සාකච්ඡා මගින් තීරණවලට එළඹීම.
   B - විරුද්ධ මත නොඉවසීම.
   C - සහයෝගයෙන් කටයුතු කිරීම.
   D - සුළුතර මත ගරු කිරීම.

   (1) AB (2) BD (3) BC (4) CD.

21. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලතල ක්‍රියාවට නංවන්නේ,
   (1) පාර්ලිමේන්තුව විසිනි.
   (2) මහජනතාව විසිනි.
   (3) පාර්ලිමේන්තුව හා මහජනතාව විසිනි.
   (4) ජනාධිපති විසිනි.

22. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මහජනතාව,
   (1) බලයේ මුල්ම හිමිකරුවාවේ.
   (2) බලයේ ප්‍රබල හිමිකරුවාවේ.
   (3) බලයේ අවසාන හිමිකරුවා වේ.
   (4) බලය ක්‍රියාවට නැංවීමේ වගකීම දරන්නාවේ.

23. ආර්ථිකයක් තුළ ආධිපත්‍යධාරී පිරිසක් විසින් අනෙක් අය මෙහෙයවීමට ගන්නා උත්සාහය බලය ලෙස විග්‍රහ කරන්නේ,
   (1) සමාජ විද්‍යාත්මක පදනමක් යටතේය.
   (2) ආර්ථික විද්‍යාත්මක පදනමක් යටතේය.
   (3) දේශපාලන විද්‍යාත්මක පදනමක් යටතේය.
   (4) වාර්ගික පදනමක් යටතේය.

24. මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කරන්නේ,
   (1) ජනාධිපතිවරයාය.
   (2) මහඇමතිවරයාය.
   (3) ආණ්ඩුකාරවරයාය.
   (4) අගමැතිවරයාය.

- **පහත ප්‍රකාශන කියවා 25, 26 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

   A - පළාත් අයවැය ලේඛනය සැකසීම.
   B - පළාත් සභා ප්‍රඥප්තිය අනුමත කිරීම.
   C - පළාතේ ආර්ථික සංවර්ධන සැලසුම් සකස් කිරීම.
   D - පළාත් සභාව ඇමතීම හා සන්දේශ යැවීම.
   E - පළාත් සභාව කැඳවීම වාර අවසන් කිරීම හා විසුරුවාහැරීම.
   F - පළාතේ පරිපාලන සැලසුම් සකස් කිරීම.

25. පළාත් සභාවක අණ්ඩුකාරවරයා සතු බලතල අඩංගු පිළිතුර තෝරන්න,
   (1) ABC (2) BDE (3) DEF (4) ABF

26. පළාත් සභාවක මහඇමතිවරයා සතු බලතල අඩංගු පිළිතුර තෝරන්න,
   (1) ACF (2) BDE (3) DEF (4) CEF

27. පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන්නේ,
   (1) පුරවැසි සභාවයි.
   (2) මහ සභාවයි.
   (3) පුරවැසි අංගනයයි.
   (4) කාරියටිඩිස් අංගනයයි.

28. ඇමරිකා එක්සත් ජනපදය සංධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට බලපෑ හේතුවක් වන්නේ
   (1) ජනගහනයේ වර්ධනයයි.
   (2) භූමි ප්‍රමාණය විශාලවීමයි.
   (3) සමාජ අවශ්‍යතා සංකීර්ණවීමයි.
   (4) ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීමයි.

29. ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය හඳුන්වන නිලනාමය වන්නේ මින් කුමක් ද?
   (1) සෙනෙට් මණ්ඩලය.
   (2) කොංග්‍රස් මණ්ඩලය.
   (3) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය.
   (4) පාර්ලිමේන්තුව.

30. ප්‍රංශය, ඉතාලිය, ජර්මනිය, ඕස්ට්‍රියාව, යන රටවල් හතරට මැදිව පිහිටා ඇති රට වන්නේ
(1) ඇමරිකාවයි. (2) උතුරුකොරියාවයි. (3) බ්‍රිතාන්‍යයයි. (4) ස්විට්සර්ලන්තය

31. සංස්කෘතිය පිළිබඳව අදහස් ඉදිරිපත් කළ චින්තකයෙක් වන්නේ,
(1) ටී. බී. ටයිලර් (2) J. R. ලවෙල් (3) ලෙනාඩ් වුල්ෆ් (4) සිලර්

32. සංකේතානුසාරයෙන් සමාජීය ලෙස හිමිකරගත්තාවූද, පාරම්පරික වශයෙන් අත්පත් කොට ගන්තා වූද සියලුම චර්යා රටාවන්ට දිය හැකි සාමූහික නාමය
(1) දැනුමයි. (2) කුසලතායි. (3) ආකල්පයයි. (4) සංස්කෘතියයි.

33. සමාජ සාධාරණත්වය බිඳවැටීමට බලපෑ හේතුවක් වන්නේ මින් කුමක් ද?
(1) අල්ලස හා දූෂණය අඩුවීම
(2) රාජ්‍ය පාලකයන් වගකීමකින් කටයුතු කිරීම
(3) පෞද්ගලික අංශය ජාතික අභිලාශ අනුව කටයුතු කිරීම.
(4) රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීමයි.

34. යහපාලනය යනුවෙන් හැඳින්වෙන්නේ.
(1) රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ ක්‍රියාවලියයි.
(2) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියයි.
(3) රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියයි..
(4) මේ එකක්වත් නොවේ..

- පහත ප්‍රකාශන කියවා 35, 36 ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.
  A - විජය ඇතුළු පිරිස පැමිණීම.
  B - පණ්ඩුවාසදේව ඇතුළු පිරිස පැමිණීම..
  C - සේන ගුත්තික පැමිණීම..
  D - භද්දකච්ඡායනා ඇතුළු පිරිස පැමිණීම.
  E - කාලිංග මාඝ පැමිණීම.
  F - පණ්ඩු පාරින්ද ඇතුළු පිරිස පැමිණීම.

35. ඉහත ප්‍රකාශවලින් සංක්‍රමනය සඳහා උදාහරණ අඩංගු පිළිතුර තෝරන්න.
(1) ABC (2) ABD (3) BCD (4) DEF

36. ඉහත ප්‍රකාශ වලින් ආක්‍රමණ සඳහා උදාහරණ අඩංගු පිළිතුර තෝරන්න,
(1) ABC (2) BCD (3) CEF (4) CDE

37. පහත ප්‍රකාශ කියවා යහපාලනික ගුණාංග දෙකක් පමණක් අඩංගු පිළිතුර තෝරන්න,
A - වගවීමෙන් කටයුතු කිරීම. B - වගකීමෙන් කටයුතු කිරීම.
C - අයිතිවාසිකම් බුක්ති විඳීම. D - නීති ගරුක වීම.
(1) AD (2) BC (3) CD (4) BD

38. විවිධ භාෂා ඉගෙනීම හා භාවිතය මිනිසා සතු
(1) ආර්ථික අයිතිවාසිකමකි. (3) සිවිල් අයිතිවාසිකමකි
(2) දේශපාලන අයිතිවාසිකමකි. (4) සමාජ හා සංස්කෘතික අයිතිවාසිකමකි

39. නූතන ජාතික රාජ්‍ය සංකල්පයේ අදහස වන්නේ මින් කුමක් ද?
(1) එක් රාජ්‍යයක විවිධ ජාතීන් ජීවත්වීමයි
(2) එක් ජාතියකට එක් රාජ්‍යයක් ලෙස ක්‍රියාත්මක වීමයි.
(3) එක් ජාතියකට විවිධ රාජ්‍ය ලබා දීමයි.
(4) සියලු රාජ්‍යයන් පොදු හැඟීමෙන් කටයුතු කිරීමයි.

40. බහු සංස්කෘතික ජන සමාජයක යහ පැවැත්ම සඳහා
(1) ගැටුම් අවම කළ යුතුය
(2) ගැටුමට තුඩු දෙන සාධක තාවකාලිකව අත්හිටුවිය යුතුය.
(3) සාමූහිකත්වය වර්ධනය කළ යුතුය.
(4) සාර්ව ආගමික වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය - II**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක්ද සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) I. ග්‍රීක සෘජු ප්‍රජාතන්ත්‍රවාදය යටතේ පාලනයට සහභාගී වීමට අවස්ථාව නොලැබුණු සමාජ කණ්ඩායම් දෙකක් ලියන්න.

ii. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න.

iii. ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත් වීමට බලපාන හේතු දෙකක් ලියන්න.

iv. වර්තමාන ආණ්ඩුක්‍රමය තුළ ව්‍යවස්ථාදායකයේ කාර්යයන් දෙකක් ලියන්න.

v. නූතන රාජ්‍ය තුළ දැකිය හැකි ආණ්ඩුක්‍රම වල ප්‍රධාන ස්වරූප දෙක ලියන්න.

vi. සංඝීය ආණ්ඩුක්‍රම පවතින රටවලට උදාහරණ 2 ක් දෙන්න.

vii. පළාත් සභා සතු බලතල හා කාර්යයන් බෙදා දැක්විය හැකි ලැයිස්තු දෙකක් ලියන්න.

viii. ස්විට්සර්ලන්ත කැන්ටන සතු බලතල දෙකක් ලියන්න.

ix. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

x. වර්තමානයේ බහු සංස්කෘතිකභාවය හොඳින් ප්‍රයෝජනයට ගන්නා රටවල් දෙකක් ලියන්න.

(ලකුණු $2 \times 10 = 20$)

(02) i. පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප දෙකක් ලියන්න. (ල. 02)

ii. ඒක පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවලට නිදසුන් 3 ක් ලියන්න. (ල. 03)

iii. තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ 3 ක් ලියා එකක් විස්තර කරන්න. (ල. 05)

(03) I. රාජ්‍යයේ මූලික අංග 2 ක් ලියන්න. (ල. 02)

ii. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 03)

iii. රාජ්‍යයට පැවරෙන කාර්යයන් තුනක් ලියා එකක් විස්තර කරන්න. (ල. 05)

(04) i. බලයේ විවිධ ස්වරූප දෙකක් ලියන්න

ii. නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු 3 ක් ලියන්න.

iii. i. ඒකීය රාජ්‍යයක දැකිය හැකි ලක්ෂණ 3 ක් ලියන්න.

ii. සංධීය රාජ්‍යයක දැකිය හැකි ලක්ෂණ 2 ක් ලියන්න.

(05) i. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම පිළිබඳව ඉතිහාසයෙන් නිදසුන් දෙකක් දෙන්න.

ii. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන තුන නම් කරන්න.

iii. i. පළාත් පාලන පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා බලපෑ හේතු 2 ක් ලියන්න.

ii. එම එක් ආයතනයක ප්‍රධාන නිලයෙහි බලතල 3 ක් ලියන්න.

(06) i. ඉතා සංකීර්ණ බහු සංස්කෘතියක් පවතින රටවලට උදහරණ දෙකක් දෙන්න.

ii. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක තුනක් ලියන්න.

iii. බහු සංස්කෘතික ජන සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන වාසි තුනක් දක්වා එකක් විස්තර කරන්න.

(07) i. මිනිසා සතු දේශපාලන අයිතිවාසිකම් දෙකක් ලියන්න.

ii. යහපාලනයක මූලික ගුණාංග තුනක් ලියන්න.

iii. බහු සංස්කෘතික ජන සමාජයක යහ පාලනය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් දක්වා එකක් විස්තර කරන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(4) | 3 -(2) | 4 -(2) | 5 -(1) | 6 -(1) | 7 -(1) | 8 -(4) | 9 -(3) | 10 -(1) |
| 11-(2) | 12 -(4) | 13 -(1) | 14 -(3) | 15 -(3) | 16 -(1) | 17 -(2) | 18 -(3) | 19 -(1) | 20 -(2) |
| 21-(3) | 22 -(3) | 23 -(2) | 24 -(3) | 25 -(2) | 26 -(1) | 27 -(2) | 28 -(4) | 29 -(2) | 30 -(4) |
| 31-(1) | 32 -(4) | 33 -(4) | 34 -(3) | 35 -(2) | 36 -(3) | 37 -(1) | 38 -(4) | 39 -(2) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. ස්ත්‍රීන්, විදේශීය වෙළඳුන්, වහලුන්

ii. එබ්‍රහම් ලින්කන්, සීලර්

iii. (i) මහජන කැමැත්ත මත සිදු වීම

(ii) ආණ්ඩු බලය ජනතා ඡන්දයෙන් වැඩි නියෝජනයක් පිරිසත් තේරීපත්වූ පක්ෂයට හෝ කණ්ඩායමට හිමිවීම.

iv. මුදල් පාලනය, විධායක පාලනය, නීති සම්පාදනය

v. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය, ජනාධිපති ආණ්ඩු ක්‍රමය.

vi. ඇමරිකාව, ස්විට්සර්ලන්තය

vii. (i) පළාත් සභා ලැයිස්තුව, (ii) සංවෘත ලැයිස්තුව (iii) සමගාමී ලැයිස්තුව

viii. අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය පුවත් පත් , මහාමාර්ග, කර්මාන්ත, ආගමන......... ආදී.

ix. විවිධ ජන වර්ග, විවිධ ආගමික විශ්වාස දරණ අය ජීවත්වීම ..... ආදී

x. සිංගප්පූරුව, ස්විට්සර්ලන්තය. (ලකුණු 2×10=20)

(02) i. ඒකපක්ෂ, ද්විපක්ෂ, බහුපක්ෂ (ල.02)

ii. චීනය, කියුබාව, උතුරු කොරියාව (ල.03)

iii. අත්තනෝමතික පාලකයන් බිහිවීම වැලැක්වීම, ජනමත නියෝජනයට ඇති ඉඩකඩ පුළුල්වීම විවිධත්ව තුළින් එක්සත් බව ගොඩනැගීම, ආදිය දක්වා එකක් විස්තර කිරීම (ල.05)

(03) i. භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍ය (ල.02)

ii. 
- එක් ජාතිකයකට එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදිංචිවීම
- භූමිය ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය මත පදනම්වීම
- වෘත්තිය නිලබල පැලැන්තියක් මගින් පාලන බලය මෙහෙයවීම.
- අභ්‍යන්තර හා බාහිර කටයුතු පිළිබඳ ස්වාධිපත්‍ය බලය හිමිවීම (ල.03)

iii. 
- නීතිය හා සාමය ආරක්ෂා කිරීම. සමාජ සුභසාධන සේවා සැපයීම, පොදු සේවා පවත්වාගෙන යාම........, ආදිය ලියා එකක් විස්තර කිරීම.

(කුරුණුවලට 3 යි. විස්තරයට 2 යි) (ල.05)

(04) i. දේශපාලන බලය, පරිපාලන බලය, ආර්ථික බලය, සමාජ බලය (ල.02)

ii. 
- විවිධත්වය තුළින් එක්සත් බව ගොඩනගා ගැනීම • ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම
- රාජ්‍ය විශාල වීම නිසා එක් මධ්‍යස්ථානයක සිට පාලන කටයුතු සිදු කිරීම පහසුවීම. (ල.03)

iii. 
- ත්‍රිවිධ බලතල එක් මාධ්‍යම ආණ්ඩුවකින් ක්‍රියාත්මක වීම
- මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය මට්ටමින් විමධ්‍යගත කිරීම.
- එම බලතල ඕනෑම අවස්ථාවක මධ්‍යම ආණ්ඩුවට පවරා ගත හැකි වීම. ..... ආදී කරුණු 3 ක් ලියා එකක් විස්තර කරන්න

(කුරුණුවලට 3 යි. විස්තරයට 2 යි) (ල.05)

(05) i. පණ්ඩුකාභය රජු ගාමිණී ගම්භාර වැනි නිලධාරීන් පත් කිරීම
පොළොන්නරු යුගයේ මහා පරාක්‍රමබාහු රජු විසින් ප්‍රාදේශීය පාලකයන් පත්කිරීම. (ල.02)

ii. මහනගර සභා, නගරසභා, ප්‍රාදේශීය සභා (ල.03)

iii. ● මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන කටයුතු පහසුකර ගැනීම. කාර්යක්ෂම මහජන සේවාවන් සැපයීම. (ල. 02)
<u>නගරාධිපති / සභාපති</u>
ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කිරීම.
සභාව කැඳවීම මුලසුන ගැනීම හා සභාව කල් තැබීම
මහජන උපයෝගිතා සේවා සැපයීමට මුල්වීම. ආදී (ල. 03)

(06) i. ඉන්දියාව, ආමරිකාව (ල.02)

ii. පිහිටීම, සංක්‍රමණ, ආක්‍රමණ, ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම (ල.03)

iii. ගැටුම් අවම වේ.
● මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ
● ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ............ ආදී 3න් ලියා එකක් විස්තර කිරීම (ල.05)

(07) i. ● තමන් කැමති දේශපාලන මතවාදයක් දැරීම. (ල.02)
● නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම (ල.02)

ii ● මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම
● අයිතිවාසිකම් සුරුකීම හා තහවුරු කිරීම
● විනිවිදභාවයෙන් කටයුතු කිරීම (ල.03)

iii. ● එකිනෙකා අතර අවබෝධය පුලුල්වේ
● එකිනෙකාට ගරු කිරීමට හැකිවේ
● නීතිගරුක පුරවැසියන් ලෙස ජීවත්වීමට හුරුවේ. (කරුණු තුනක් ලියා එකක් විස්තර කළ යුතුය) (ල.05)